# නවගත්තේගම ප්‍රාදේශීය සභාව

## නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ සේවා ගිවිසුම් පදනම මත මුරකරු තනතුරු සඳහා බඳවා ගැනීම

නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා අනියම් පදනම මත ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ පහත සඳහන් තනතුරට සුදුස්සන් තෝරා පත් කර ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති නවගත්තේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට ආසන්නව ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *තනතුර* :

| | | | |
|---|---|---|---|
| I. | තනතුරු නාමය | : | මුරකරු |
| II. | තනතුරු ගණන | : | 02 |
| III. | වැටුප් ක්‍රමය මාසික | : | අංක 3/2016 හා 2016.02.25 දිනැති රා. ප. චක්‍රලේඛයට අනුව PL-1-2016<br>රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 ක් වේ. |
| IV. | අධ්‍යාපන සුදුසුකම් | : | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් විෂයයන් 2ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම්* :

1. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
2. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය.
3. අයදුම්කරු නවගත්තේගම ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ තුන් අවුරුද්දකට නොඅඩු කාලයක ස්ථිර පදිංචිකරුවෙක් විය යුතුය. (වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සනාථ කර තිබිය යුතුය).
4. අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙක් නොවිය යුතුය.
6. අයදුම්කරුවන් තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* :

i. මෙම තනතුරට බඳවාගනු ලබන්නේ දෛනික වැටුප් ගෙවීමේ පදනම මතය.
ii. ඔබ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිපත්තිමය තීරණ වලට යටත් විය යුතුය.
iii. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තු නියෝගවලට ද රජය හෝ පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරන වෙනත් රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව ක්‍රියා කිරීමට සියලු සේවකයින් බැඳී සිටිය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය* :

01. අවශ්‍යතාවය අනුව ව්‍යුහගත හෝ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් තෝරා ගැනේ.
02. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතික පත් වල සහතික කළ පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

    *(අ)* උප්පැන්න සහතිකය
    *(ආ)* අධ්‍යාපන සහතික

03. තම පදිංචිය සහතික කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය
04. මෑතක දී ලබා ගත් චරිත සහතික 02 ක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිගෙන් ලබා ගත් සහතිකයක් විය යුතුය.)
05. වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික තිබේ නම් එම සහතික
06. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

07. අයදුම්කරුවන් මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2023.03.27 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, නවගත්තේගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. නිවැරදි ව සම්පූර්ණ කර නොමැති, අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
නවගත්තේගම ප්‍රාදේශීය සභාව.

2023 ක් වූ පෙබරවාරි මස 27 වැනි දින දී ය.
නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ දී ය.